## කැලණිය අධ්‍යාපන කලාපය

### දෙවන වාර පරීක්ෂණය - 2017 - ජූලි

**9 ශ්‍රේණිය** **චිත්‍ර කලාව - I** **කාලය : පැය 01**

නම: ..........................................................................................................

**උපදෙස්: සියළුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න.**

- **අංක 01 සිට 05 දක්වා පහත සඳහන් පින්තූරය හඳුනාගෙන හිස්තැන් පුරවන්න.**



මෙම 01. ................................................ බුද්ධ ප්‍රතිමාවයි. 02. ................................................ යුගයේ නිර්මාණය වූ මෙය 03. ................................................ නැමති ගල් විශේෂය භාවිත කොට ඇත. මෙයින් පිළිබිඹු වන්නේ 04. ................................................ අවස්ථාවය. 05. ................................................ මුද්‍රාව සහිත මෙම පිළිමය පද්මාසනයෙන් වැඩ හිඳී.

- **අංක 06 සිට 10 තෙක් නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.**

06. බුදු පිළිමවල එන ආසන ක්‍රමවල යෝගාසන යනුවෙන් හඳුන් වන්නේ,
    (1) විරාසන ක්‍රමයයි. (2) පද්මාසන ක්‍රමයයි. (3) භද්‍රාසන ක්‍රමයයි. (4) සිංහාසන ක්‍රමයයි.

07. වෙස් මුහුණු නිර්මාණය කිරීමේ පියවරයක් නොවන්නේ පහත සඳහන් කවරක් ද?
    (1) ගණ කැපීම (2) පායම් පෑහීම (3) ලැටු කෙටීම (4) කිරි හිඳවීම

08. ''ඉද්ද'' හා ''හැඳගත'' උපකරණය භාවිතයට ගනු ලබන්නේ,
    (1) ලාක්ෂා කර්මාන්තය සඳහාය. (2) පිත්තල කර්මාන්තය සඳහාය.
    (3) වෙස්මුහුණු කර්මාන්තය සඳහාය. (4) පැදුරු කර්මාන්තය සඳහාය.

09. ඇම්බැක්කේ දේවාලය අයත් වන්නේ,
    (1) මහනුවර යුගයටය. (2) ගම්පොල යුගයටය.
    (3) පොළොන්නරු යුගයටය. (4) දඹදෙණි යුගයටය.

10. පනාවිටිය අම්බලම පිහිටා ඇත්තේ,
    (1) කුරුණෑගල දිස්ත්‍රික්කයේය. (2) අනුරාධපුර දිස්ත්‍රික්කයේය.
    (3) මාතලේ දිස්ත්‍රික්කයේය. (4) මහනුවර දිස්ත්‍රික්කයේය.

- **අංක 11 සිට 15 තෙක් දී ඇති එක් එක් වාක්‍යවල හිස්තැනට ගැලපෙන වචනය පහතින් තෝරා ලියන්න.**

**විජ්ජුලතා, මේඝලතා, රජවාසල, ගුප්ත සම්ප්‍රදාය, සාලිය අශෝකමාලා, පල්ලව සම්ප්‍රදාය**

11. ඉසුරුමුණි විහාරයේ කැටයම් අතර ඇති පෙම් යුවල කැටයමෙහි දක්නට ඇත්තේ ........................ යයි.
12. ගල් විහාර පිළිමගේ බුදු පිළිමවල ඇත්තේ ........................................ සහිත ලක්ෂණයයි.
13. සීගිරි සිතුවම් පිළිබඳ පරණවිතාන මහතාගේ මතයට අනුව එහි දැක්වෙන රූප ........................................ ලෙස හඳුන්වයි.
14. ඉසුරුමුණි පෙම්යුවල කැටයම ........................................ යුගයට අයත් වේ.
15. ........................................ කැටයම් ඉසුරුමුණි විහාරයේ දක්නට ඇති පල්ලව සම්ප්‍රදායට අයත් කැටයමකි.

- **අංක 16 සිට 20 තෙක් වැරදි වාක්‍ය සඳහා X ලකුණු ද නිවැරදි වාක්‍ය සඳහා √ ලකුණ ද යොදන්න.**

16. පොත්ගුල් විහාර ප්‍රතිමාව මහා පරාක්‍රමබාහු රජුගේ ප්‍රතිමාවයි. ( )
17. ගල් විහාරයේ හිටි පිළිමයේ ඇත්තේ අභය මුද්‍රාවයි. ( )
18. සීගිරි සිතුවම් ඇඳ ඇත්තේ ප්‍රෙස්කෝ සිකෝ ක්‍රමයටයි. ( )
19. "වංක ගිරිය" නම් වූ පැදුරු රටා මෝස්තරයක් ඇත. ( )
20. ඇම්බැක්කේ දේවාලය කතරගම දෙවියන් උදෙසා නිර්මාණය කරන ලද්දකි. ( )

- **අංක 21 සිට 25 තෙක් දී ඇති වචනවල අර්ථයට පැහැදිලි වන සේ සම්පූර්ණ වාක්‍ය බැගින් ලියන්න.**

21. උෂ්ණිෂය ........................................................................................................
22. හිරියල් ........................................................................................................
23. අල්ලියාදු ........................................................................................................
24. පන්විල ........................................................................................................
25. ඊ වඩුවන් ........................................................................................................

- **අංක 26 සිට 30 තෙක් පින්තූර ගලපා ගැලපෙන අක්ෂරය ලියන්න.**

16. 

................................

 A

17. 

................................

 B

18. 

 C

19. 

 D

20. 

 E

- **අංක 31 සිට 35 තෙක් සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

31. ද්විතීක වර්ණ යුගලයක් වන්නේ,
    (1) කහ, තැඹිලි (2) රතු, කොළ (3) දම්, තැඹිලි (4) නිල්, දම්

32. සාදිලිංගම්
    (1) කහ පාටයි (2) තැඹිලි පාටයි (3) නිල් පාටයි (4) රතු පාටයි

33. පාරම්පරික ශිල්පීන් මුලින්ම ගෝලයාට දුන් අභ්‍යාසය වන්නේ,
    (1) අරිම්බුවයි (2) වක දෙකයි (3) ගල් බින්දුවයි (4) පළාපෙති මෝස්තරයයි

34. දුර ඇති දේ කුඩාවට දැක්වීම හඳුන්වන්නේ,
    (1) පර්යාවලෝකය යනුවෙනි. (2) දුර දැක්වීම යනුවෙනි.
    (3) ත්‍රිමාණ බව යනුවෙනි. (4) චිත්‍රයේ ගැඹුර යනුවෙනි.

35. කිසියම් අදහසක් කැටිකර පණිවුඩයක් ලබාදීම සඳහා අඳින ලද සරල සංකේත සහිත චිත්‍ර,
    (1) කොලාජ් චිත්‍ර නමින් හඳුන්වයි. (2) කාටූන් චිත්‍ර නමින් හඳුන්වයි.
    (3) සාම්ප්‍රදායික චිත්‍ර නමින් හඳුන්වයි. (4) පෝස්ටර් චිත්‍ර නමින් හඳුන්වයි.

- අංක 36 සිට 40 තෙක් දී ඇති ප්‍රශ්නවලට රූප සටහන උපයෝගී කරගෙන අර්ථවත් වාක්‍ය 05 ක් ලියන්න.



36. හඳුනාගත් බව ........................................................................................

........................................................................................

37. ස්ථානය ........................................................................................

........................................................................................

38. අවස්ථාව ........................................................................................

........................................................................................

39. නිර්මාණය කරන ලද රජු ........................................................................................

........................................................................................

40. චිත්‍ර සම්ප්‍රදාය ........................................................................................

........................................................................................

# කැලණිය අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2017 - ජුලි

9 ශ්‍රේණිය

## චිත්‍ර කලාව - II

- පහත දැක්වෙන මාතෘකා අතරින් එක් චිත්‍රයක් පමණක් තෝරාගෙන ඇඳ වර්ණ කරන්න.

### "අ" කොටස

01. පාසලේ ශ්‍රමදානයක්

02. වනයේ සැරිසරන සතුන්

03. ආගමික පරිසරයක්

### "ආ" කොටස

04. මල් හා කොළ යෙදූ ව්‍යාප්ත මෝස්තරයක්

05. සාම්ප්‍රදායික සැරසිලි යෙදූ බතික් සරමකට වාටියක්

### "ඇ" කොටස

06. සබන් දවටනයකට සුදුසු නිර්මාණයක්

02. ගුහා සිතුවම් තේමා කොට ගත් අල්ප උන්නත බිතු කැටයමකට සුදුසු නිර්මාණයක්